# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 10 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024 திகதி

දිනය / Date: 03/01/2024 පැය 1540

## මාධ්‍ය නිවේදනය

**01. වෙඩි තැබීමක් - හුංගම පොලිස් වසම.**

2024.01.02 වන දින රාත්‍රී කාලයේ හුංගම පොලිස් වසමේ කිවුල, හුංගම ප්‍රදේශයේදී නිවසකට ගිනි අවියකින් වෙඩි තැබීමක් සිදුකර ඇති බවට හුංගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

මෙම නිවසේ හිමිකරු හා තවත් පුද්ගලයෙකු සමඟ ඇතිව තිබූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෙරට නිෂ්පාදිත ගිනි අවියකින් වෙඩි තැබීම සිදුකර ඇති අතර මෙම නිවසේ කාමරයක දොරට වෙඩි පහරවල් කිහිපයක් එල්ලවී ඇති බවට නිරීක්ෂණය වී ඇත. වෙඩි තැබීම හේතුවෙන් ජීවිත හානී හෝ තුවාල සිදුවී නොමැති අතර වෙඩි තැබීම සිදුකල සැකකරු ගිනි අවිය ද සමඟ හුංගම පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත. හුංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - තිරුක්කෝවිල් පොලිස් ස්ථානය.**

2024.01.02 වන දින රාත්‍රී කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ රූපස්කුලම් වැව ආසන්න කැලෑ ප්‍රදේශයේදී තිරුක්කෝවිල් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත තිරුක්කෝවිල් පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන තිරුක්කෝවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** තිරුක්කොවිල් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය**

2024.01.02 වන දින සවස් කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ හැදල තොටුපොල පාර, මට්ටක්කුලිය ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200** ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 23 ක් වූ මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මට්ටක්කුලිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**